# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

## 5 ශ්‍රේණිය - පරිසරය ( නොවැම්බර්-1 සතිය )

### 14 තේමාව - අපට කළහැකි වෙනස්කම්

❖ ක්‍රියාකාරකම 1

අපි පුතේ අද නිර්මාණයක් කරමු. ඔබ පාසල් කාලය තුළ විවිධ අවශ්‍යතා සඳහා පන්තිකාමරයෙන් බැහැරට යනවා නේද? ඒ සඳහා අවසර පත්‍රයක් හදමු. ඒ සඳහා ඝනකම කාඩ්බෝඩ් කැල්ලක් ගන්න. (එය **8 cm x 5 cm**) සවිමත් නූලක්, පාට, හිල් විදිනයක් ගන්න. ප්‍රථමයෙන් කැමති ආකාරයට කාඩ්බෝඩ් කැල්ල දෙපැත්ත පාට කරන්න. එය කැමති ආකාරයට අලංකාර කරගන්න. එහි හරි මැදින් සිදුරක් විද නූල දමන්න. (එය පන්තියට රැගෙන එන්න.)

❖ ක්‍රියාකාරකම 2.

ඔයාලා දන්නවද අපේ අතීත මුතුන්මිත්තන් විසින් භාවිතා කරන ලද අද අපෙන් නැතිවී යන පැරණි ශිල්ප ශාස්ත්‍ර පිළිබඳ තොරතුරු බොහෝ ඇත. (දේශීය ඥානය හා අපේම අනන්‍යතාවයෙන් යුතු භාවිත) වැඩිහිටියන්ගෙන් අසා පොල්අත්තක් වියන්න. කුඩා වට්ටියක් වියන්න. වැඩිහිටියන් දන්නා වෙනත් වියමන් ක්‍රම අසා දැනගන්න. (පිරිත්පැන් කළය ගොක්කොළ වලින් අලංකාර කරන්න.)



❖ ක්‍රියාකාරකම 3.

ගොක්කොළ අත්තක් ගෙන නිවසේ පියා හෝ වෙනත් වැඩිහිටියෙකුගෙන් අහගෙන ආරුක්කුවක් සාදන ආකාරය ඉගෙන ගන්න.

පහත දේවල් පිළිබඳව වැඩිහිටියන්ගෙන් අසා ඒවා පිළිබඳව තොරතුරු ලියන්න.

1. කෙම්ක්‍රම.
2. හෙළ වෙදකම.
3. කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම.
4. මූර්ති කැටයම් කලා ශිල්ප ක්‍රම.

E nanapiyasa 5 ශ්‍රේණිය පරිසරය -14 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.